# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.11.27 පැය 1015 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/2120/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


## 01. පස් කන්දක් නාය යාම හේතුවෙන් කාන්තාවක් මිය යාමක් - ලුණුගල පොලිස් වසම.

2025.11.27 වන අද දින අළුයම් කාලයේ ලුණුගල පොලිස් වසමේ කිවුලේගම ප්‍රදේශයේ නිවසක් මතට පස් කන්දක් කඩා වැටීමෙන් කන්තාවන් දෙදෙනෙකු හා කුඩා පිරිමි දරුවෙකු යටවී ඇති අතර, ප්‍රදේශවාසීන් විසින් ඔවුන් මුදාගෙන ලුණුගල රෝහලට ඇතුලත් කර ඇති අතර එහිදී එක් කාන්තාවක් මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 37 ක් වූ කිවුලේආරාව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය ලුණුගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර තුවාලකරුවන් ලුණුගල රෝහලේ ප්‍රතිකාර ලබයි. ලුණුගල පොලිසිය වැඩිදුර විමර්ශන කටයුතු සිදු කරනු ලබයි.

## 02. නාය යෑම් හේතුවෙන් පුද්ගලයින් සිව්දෙනෙකු අතුරුදන්වීමක් - මඩොල්සිම පොලිස් වසම.

2025.11.26 වන දින රාත්‍රී කාලයේ මඩොල්සිම පොලිස් වසමේ මැටිගහතැන්න ප්‍රදේශයේ හා බත්තැව ප්‍රදේශයේ නිවාස දෙකක් නායයාම හේතුවෙන් එම නිවෙස්වල රැඳී සිටි පිරිමි පුද්ගලයින් දෙදෙනෙකු, කාන්තාවක් සහ දැරියක් මේ වන විට අතුරුදන් වී ඇත.

මඩොල්සිම පොලිසිය, යුධ හමුදා නිලධාරීන් හා එක්ව ආපදාවට ලක් වූවන් මුදවා ගැනීමේ මෙහෙයුම් සිදුකරමින් පවතී.

## 03. නිවාස දෙකක් ආපදාවට ලක්වීම - උඩුදුම්බර පොලිස් වසම.

2025.11.26 වන දින රාත්‍රී කාලයේ උඩුදුම්බර පොලිස් වසමේ උඩුවාහින්න ප්‍රදේශයේ නිවාස දෙකක් මතට පස් කන්දක් කඩාවැටීම හේතුවෙන් එම නිවාස සම්පූර්ණයෙන් යට වී ඇති අතර එම අවස්ථාවේ එක් නිවසක රැඳී සිටි පියෙකු සහ පුතෙකු මේ වන විට අතුරුදන්වී ඇත. අනෙක් නිවසෙහි කිසිවෙකු රැඳී සිට නොමැත.

**අතුරුදන් වූ අයවළුන් අවුරුදු 18 හා 55 වයස්වල පසුවන උඩුවාහින්න, මහවල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

උඩුදුම්බර පොලිසිය, යුධ හමුදා නිලධාරීන් හා එක්ව ආපදාවට ලක් වූවන් මුදවා ගැනීමේ මෙහෙයුම් සිදුකරමින් පවතී.

## 04. ආපදා තත්ත්වයක් හේතුවෙන් මාර්ග අවහිරතාවයක් - උඩුදුම්බර පොලිස් වසම.

2025.11.27 වන දින අළුයම් කාලයේ උඩුදුම්බර පොලිස් වසමේ උඩුදුම්බර මඩුගල්ල මාර්ගයේ ගංගොඩ ප්‍රදේශයට ගල් හා පස් කඩාවැටීම හේතුවෙන් නිවාස ගණනාවකට හානි සිදුවී ඇති අතර පවතින දැඩි වර්ෂාව හා සුළං තත්ත්වය හේතුවෙන් එම ප්‍රදේශයේ සියළුම මාර්ග අවහිර වී ඇත.

පොලිසිය, යුධ හමුදා නිලධාරීන් හා එක්ව ආපදාවට ලක් වූවන් මුදවා ගැනීමේ මෙහෙයුම් සිදුකරමින් පවතී.

## **05. කටුගස්තොට විද්‍යාර්ථ විද්‍යාලයේ පැති බැම්ම හේතුවෙන් මාර්ග අවහිරවීම - කටුගස්තොට පොලිස් වසම.**

2025.11.26 වන දින රාත්‍රී කාලයේ කටුගස්තොට පොලිස් වසමේ විද්‍යාර්ථ විද්‍යාලයේ ක්‍රීඩාංගණයේ පැති බැම්මේ කොටසක් කඩාවැටීම හේතුවෙන් නිත්තවෙල හරහා ගල්කඩුව දක්වා ඇති මාර්ගය සම්පූර්ණයෙන් අවහිර වී ඇත.

මේ හේතුවෙන් ජීවිත හානි කිසිවක් වාර්තා වි නොමැති අතර මාර්ග අවහිරය ඉවත් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**